# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2133/36- 2019 ජූලි මස 24 වැනි බදාදා - 2019.07.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී.1/2019

**2016 අංක 14 දරන අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටුකිරීම) පිළිබඳ පනත**

2016 අංක 14 දරන අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පිළිබඳ පනතේ 12 වන වගන්තියේ (ඊ) ඡේදය යටතේ අධිකරණ සහ බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් නිකුත් කරනු ලබන මාර්ගෝපදේශ.

**තලතා අතුකෝරළ,**
අධිකරණ සහ බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

2019 ජූලි මස 18 දින,
කොළඹ දී ය.

**මාර්ගෝපදේශ**

1. පනතේ 12 වන වගන්තියේ (ඊ) ඡේදය යටතේ එසේ කිරීමට බලය පවරන ලද යම් නිශ්චිත නිලධරයකු විසින් සිදුකරනු ලබන යම් රඳවා තබාගැනීමේ ස්ථානයක් සෝදිසි කිරීමක් මේ මාර්ගෝපදේශවලට අනුකූල විය යුතු ය.

**1 වන කොටස**

**නිශ්චිත නිලධරයන් සඳහා බලය පැවරීම**

2. පනතේ 12 වන වගන්තියේ (ඊ) ඡේදය යටතේ වන බලය පැවරීමක -

(අ) සෝදිසි කිරීම සිදු කිරීම සඳහා බලය පවරන ලද නිශ්චිත නිලධරයාගේ නම සහ තනතුර:

(ආ) බලය පවරන ලද දිනය; සහ

(ඇ) සෝදිසි කිරීමේ අරමුණ

අඩංගු විය යුතු ය.

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1A - PG 4600 – 517 (2019/07)

## II වන කොටස

## පූර්ව දැනුම්දීමකින් තොරව සෝදිසි කිරීම

3. එකී රඳවා තබාගැනීමේ ස්ථානය භාර යම් තැනැත්තෙකු වෙත යම් පූර්ව දැනුම්දීමක් කිරීමෙන් තොරව යම් බලය පවරන ලද නිශ්චිත නිලධරයකු විසින්, ඕනෑම වේලාවක දී යම් රඳවා තබා ගැනීමේ ස්ථානයක් සෝදිසි කිරීමක් සිදු කරනු ලැබිය හැකි ය.

4. සෝදිසි කිරීමක් ආරම්භ කරන විට දී, යම් බලය පවරන ලද නිශ්චිත නිලධරයකු විසින් යම් රඳවා තබා ගැනීමේ ස්ථානයක් භාර තැනැත්තා වෙත අදාළ බලය පැවරීම පෙන්විය යුතු අතර එම රඳවා තබා ගැනීමේ ස්ථානය භාර නිලධරයා විසින් ඉල්ලීමක් කරනු ලබන අවස්ථාවක දී එම බලය පැවරීමේ පිටපතක් ලබා දිය යුතු ය.

## III වන කොටස

## රඳවා තබා ගැනීමේ ස්ථානයක් සෝදිසි කිරීමක් අතරතුර ක්‍රියාත්මක කළ යුතු බලතල

5. යම් බලය පවරන ලද නිශ්චිත නිලධරයකු විසින්

(අ) යම් රඳවා ගැනීමේ ස්ථානයක පරිශ්‍රයේ යම් කොටසක් සෝදිසි කිරීම;

(ආ) රඳවා ගැනීමේ තත්ත්වයන් හෝ ඕ. එම්. පී. හි කාර්යභාරයට අදාළ යම් කාරණයක් සම්බන්ධයෙන් විමසා බැලීම සඳහා එකී රඳවා තබා ගැනීමේ ස්ථානයේ සිටින යම් තැනැත්තකුගෙන් ප්‍රශ්න කිරීම ;

(ඇ) එකී රඳවා තබා ගැනීමේ ස්ථානයෙන් සොයාගත් යම් ලේඛනයක් හෝ වස්තුවක් රඳවා තබා ගැනීම ;

(ඈ) (ඇ) ඡේදයේ සඳහන් යම් ලේඛනයක පිටපත් ලබා ගැනීම;

(ඉ) එකී රඳවා තබාගැනීමේ ස්ථානයේ හෝ එකී රඳවා තබා ගැනීමේ ස්ථානයෙන් සොයාගත් යම් සලකුණක් හෝ භෞතික සාක්ෂියක් ද ඇතුළුව යම් වස්තුවක, ලේඛනයක, වාහනයක හෝ වෙනත් යම් දෙයක ඡායාරූප ගැනීම ; හෝ

(ඊ) යම් රඳවා තබාගැනීමේ ස්ථානයක තිබෙන වාහනයක් සෝදිසි කිරීම

කරනු ලැබිය හැකි ය.

## IV වන කොටස

## කාර්ය පටිපාටිමය නියමයන්

6. බලය පවරන ලද නිශ්චිත නිලධරයන් විසින් සිදු කරන ලද සියලු රඳවා ගැනීමේ ස්ථාන සෝදිසි කිරීම් සම්බන්ධයෙන් වන ලොග් පොතක් ඕ. එම්. පී. විසින් පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

7. යම් රඳවා ගැනීමේ ස්ථානයක් සෝදිසි කිරීම සිදුකරනු ලබන ඕ. එම්. පී හි යම් බලය පවරන ලද නිශ්චිත නිලධරයකු විසින්, එකී සෝදිසි කිරීම අවසන් වූ වහාම එම ලොග් පොතේ එකී සෝදිසි කිරීම පිළිබඳ ලිඛිත වාර්තාවක් සටහන් කරනු ලැබිය යුතු ය. නොවැළැක්විය හැකි අවස්ථානුගත කරුණු හේතුවෙන් එම සෝදිසි කිරීම අවසන් වූ වහාම එම වාර්තාව ඔහු විසින් සිදු කර නොමැති අවස්ථාවක දී, සාධාරණ ලෙස ප්‍රායෝගිකව හැකිතාක් ඉක්මනින් එම වාර්තා කිරීම සිදු කරනු ලැබිය යුතු ය.

8. 7 වන මාර්ගෝපදේශය යටතේ ලොග් පොතට ඇතුළත් කරන ලද ලිඛිත වාර්තාවකට

(අ) සෝදිසි කිරීම සඳහා බලය පැවරීම පිළිබඳ විස්තර ;

(ආ) සෝදිසි කිරීම් සිදුකරන ලද රඳවා තබා ගැනීමේ ස්ථානයේ ලිපිනය ;

(ඇ) සෝදිසි කිරීමේ දිනය, වේලාව සහ කාල සීමාව ;

(ඈ) සෝදිසි කිරීම සිදු කරනු ලබන අවස්ථාවේ දී රඳවා තබා ගැනීමේ ස්ථානයේ සිටි තැනැත්තන්ගේ නම් සහ ඔවුන් පිළිබඳ යම් විස්තරාත්මක තොරතුරු ;

(ඉ) සෝදිසි කිරීම් අතරතුර රඳවාගත් යම් වස්තූන්, ලේඛන පිළිබඳ විස්තර හෝ ලබා ගන්නා ලද ලේඛනවල පිටපත් ; සහ

(ඊ) 5 වන මාර්ගෝපදේශයේ (ඉ) සහ (ඊ) ඡේද යටතේ ලබාගත් යම් ඡායාරූප හෝ සෝදිසි කරන ලද වාහන පිළිබඳ විස්තර

ඇතුළත් විය යුතු ය.

9. යම් රඳවාගැනීමේ ස්ථානයක් සෝදිසි කිරීම සිදු කරනු ලබන ඕ. එම්. පී. හි යම් බලය පවරන ලද නිශ්චිත නිලධරයකු විසින්, එකී රඳවා ගැනීමේ ස්ථානයෙන් එම නිලධරයා පිටවීමට පෙර, එම සෝදිසිකිරීම අතරතුර රඳවාගත් යම් වස්තුවක් හෝ ලේඛනයක්, එසේ රඳවාගත් බව පිළිගනිමින්, එසේ රඳවා ගන්නා ලද වස්තූන් හෝ ලේඛන පිළබඳ සවිස්තරාත්මක සටහනක් ද සමඟ වන රිසිට්පතක් නිකුත් කරනු ලැබිය යුතු ය.

10. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍යා වුවහොත් මිස, මේ මාර්ගෝපදේශවල,

" පනත " යන්නෙන්, 2016 අංක 14 දරන අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පිළිබඳ පනත අදහස් වේ ;

" ලේඛනය " යන්නෙන්, යම් දෙයක් වාර්තා කිරීමේ කාර්යය සඳහා භාවිත කිරීමට අදහස් කරනු ලබන හෝ භාවිත කරනු ලැබිය හැකි වූ ද, අක්ෂරවලින්, ඉලක්කම්වලින් හෝ සලකුණු මගින් හෝ ඒවායින් එකකට වැඩි ආකාරවලින් ප්‍රකාශ කරන ලද හෝ විස්තර කරන ලද්දා වූ ද, යම් දෙයක් අදහස් වන අතර, එයට යම් ද්‍රව්‍යයක් පිළිබඳව ඉලෙක්ට්‍රොනික හෝ ඩිජිටල් මාධ්‍යයෙන් ප්‍රකාශ කරන ලද හෝ විස්තර කරන ලද යම් දෙයක් ද ඇතුළත් වේ ;

" වස්තුව " යන්නෙන්, යම් චලනය කළ හැකි ස්පර්ශ කළ හැකි දේපලක් අදහස් වේ ;

" ඕ. එම්. පී. " යන්නෙන්, පනතේ 3 වන වගන්තිය මගින් පිහිටුවන ලද අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය අදහස් වේ ;

" රඳවා තබා ගැනීමේ ස්ථානය " යන්නට, අධිකරණ නියෝගයක් මගින් හෝ අන්‍යාකාරයකින් යම් තැනැත්තකු රඳවා තබාගෙන ඇති බවට හෝ කලින් රඳවා තබාගෙන සිටි බවට සැක කරනු ලබන, යම් රඳවා තබා ගැනීමේ ස්ථානයක්, පොලිස් ස්ථානයක්, බන්ධනාගාරයක් හෝ වෙනත් යම් ස්ථානයක් ඇතුළත් වේ. ;

08-313

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.